# සාමාන්‍ය සමයේ තිස් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය නික්මයාම 22: 21 – 27

*නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.*

### කනවැන්දුම් ස්ත්‍රියකට වත් අනාථ දරුවෙකුට වත් හිරිහැර කරන විට ස්වාමින් වහන්සේ උදහස් වන සේක.

"තුඹලා විදේශිකයකුට අයුත්තක් වත් හිරිහැරයක් වත් නොකළ යුතු ය. මන්ද, තුඹලා මිසර දේශයෙහි විදේශිකයන් ව සිටි හෙයිනි. තුඹලා කනවැන්දුම් ස්ත්‍රියකට වත්, අනාථ දරුවෙකුට වත් හිරිහැර නොකළ යුතු ය. තුඹලා ඔවුන්ට හිරිහැර කොට ඔවුන් මට මොර ගැසුවොත් මම සැබැවින් ම ඔවුන්ගේ මොරගැසීමට සවන් දෙමි. එවට මගේ උදහස ඇවිළී, මම කඩුවෙන් තුඹලා නසන්නෙමි. තුඹලාගේ භාර්යාවෝ කනවැන්දුම් ස්ත්‍රීහු ද, තුඹලාගේ දරුවෝ අනාථ දරුවෝ ද වන්නෝ ය."

"තුඹලා මගේ සෙනඟ අතර සිටින දිළින්දෙකුට මුදල් ණයට දුන්නොත්, පොලියට මුදල් දෙන අය මෙන් නොහැසිරිය යුතු ය. තුඹලා බලයෙන් පොලියක් ද නොගත යුතු ය. තුඹ උගසක් මෙන් යමෙකුගේ වස්ත්‍රය ගන්නෙහි නම් ඉර බැස යාමට පෙර එය ඔහුට ආපසු දිය යුතු ය. මන්ද, ඔහුට ඇත්තේ ඒ පොරෝණය පමණක් බැවිනි. ඔහු තමාගේ ඇඟට පොරවාගන්නේ ඒ වස්ත්‍රය වේ. නැත්නම් ඔහුට නිදා ගන්න ඇත්තේ කුමක් ද? ඔහු මට මොරගසන විට මා අනුකම්පා සහගත බැවින් ඔහුට සවන් දෙමි."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 18: 1–3, 46, 50

පිළිතුර: අපගේ සව් ශක්තිය වන සමිඳුනි, අපි ඔබ වහන්සේට ප්‍රේම කරමු.

ගීය : මාගේ සව් ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි;
සමිඳාණෝ මාගේ පර්වතය ය; බලකොටුව ය, මිදුම්කාරයාණෝ ය.
ඔබ මා දෙවිඳාණෝ ය; පර්වතය ය;
මම ඔබ සරණකොට ගනිමි.

ඔබ මට පලිහ ය, ගැළවීමේ බලය ය, උස් කොටු පවුර ය.
සියලු පැසසුම් වලට හිමිකම් ඇති සමිඳුනි, මම ඔබට අයැද සිටිමි.
මෙසේ මාගේ සතුරන්ගෙන් මම ගැළවෙන්නෙමි.

සමිඳාණෝ සැරදෙත් වා!
මාගේ ප්‍රාකාරය වන එතුමන්ට පැසසුම් වේවා!
මගේ විමුක්තිදායකයාණෝ අන් හැමට පරමෝත්තම වන සේක.
එතුමාණෝ සිය රජුට ජය සිරි දෙන සේක;
තමන් අතින් අබිසෙස් ලත් දාවිත් රජුට ද ඔහුගේ වංශයට ද
සදහට ම කරුණා කරන සේක.

## දෙවන දේව ප්‍රකාශනය — 1 තෙසලෝනික 1: 5–10

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

දේවතා වන්දනාවෙන් හැරී දේව පුත්‍රයාණන්
වඩිනු බලාපොරොත්තු වන්න.

මන්ද, අප සුබ අස්න ඔබ වෙත ගෙනාවේ වචන මාත්‍රයෙන් පමණක් නොව, ශුද්ධාත්ම බලය හා සහතික විශ්වාසය ඇතිව ය. ඔබගේ යහපත උදෙසා අපි ඔබ අතර කෙසේ ජීවත් වීමු දැයි ඔබ දන්නහු ය. ඔබ ද, බොහෝ දුක් විඳිමින්, ශුද්ධාත්මයාණන්ගෙන් වන ප්‍රීතිය ඇතිව පණිවුඩය පිළිගැනීමෙන්, අප ද

සමිඳාණන් වහන්සේ ද අනුගමනය කරන්නෝ වූවහු ය. මෙලෙස ඔබ මසිදෝනියෙහි සහ ග්‍රීසියෙහි සිටින සියලු ඇදහිලිවතුන්ට ආදර්ශයක් වූවහු ය. මන්ද, ඔබ වෙතින් ස්වාමින් වහන්සේගේ පණිවුඩයේ රාවය මසිදෝනියෙහිත්, ග්‍රීසියෙහිත් පිළිරැව් දුන්නා පමණක් නොව, දෙවියන් වහන්සේ කෙරෙහි වූ ඔබේ ඇදහිල්ල සැම තැන ම පතළ විය. මේ ගැන වැඩි යමක් කීම අවශ්‍ය නැත. අප ඔබ වෙත පැමිණි විට ඔබ අප පිළිගත් ආකාරය ගැන ද, ජීවමාන වූ සත්‍ය වූ දෙවියන් වහන්සේට සේවය කරනු පිණිස ඔබ දේවතා වන්දනාවෙන් දෙවියන් වහන්සේ වෙතට හැරුණු අන්දම ගැන ද ඔව්හු ම කතා කරති. තවද, මරණයෙන් උත්ථාන කරනු ලැබූ, පැමිණෙන්නට යන උදහසින් අප මුදන්නා වූ, තමන් වහන්සේගේ පුත්‍රයාණන් වූ ජේසුස් වහන්සේ ස්වර්ගයෙන් වඩිනු බලාපොරොත්තු වෙමින් ඔබ සිටින ආකාරය ගැන ද ඔව්හු කතා කරති.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
අහෝ සමිඳුනි, ඔබ පුතණුවන්ගේ වචන පිළිගැනීමට
අප සිත් පැහැදුව මැනව.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 22: 34–40

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

**තුඹේ දෙවියන් වහන්සේට ප්‍රේම කරන්න.**
**තුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.**

ජේසුස් වහන්සේ සද්දුසිවරුන් නිරුත්තර කළ බව අසා පරිසිවරු එක්රැස් වූ හ. ඔවුන් අතරෙන් විනයධරයෙක් උන් වහන්සේ පරීක්ෂා කරමින්, "ගුරුදේවයෙනි, ව්‍යවස්ථාවලියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක් දැ"යි ඇසී ය. උන් වහන්සේ ඔහුට කතා කොට, "තුඹේ මුළු හෘදයෙන් ද තුඹේ මුළු සිතින් ද තුඹේ මුළු බුද්ධියෙන් ද

තුඹේ දෙවි ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න.'' මෙය ශ්‍රේෂ්ඨතම පළමුවන ආඥාව ය. දෙවන ආඥාව ද එයට සමාන ය. එනම්, 'තුඹ තුඹට ප්‍රේම කරන්නාක් මෙන් තුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.' යනුයි. මුළු ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය රඳා ඇත්තේ මේ ආඥා දෙක මත ය''යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*